# පාඩම:රෝම සංඛ්‍යාංක



## ක්‍රියාකාරකම - 01

(1).5 ශ්‍රේණිය ගණිතයපෙළ පොත අතට ගන්න.

(2). එහි පළමු වන පිටුවේ සිට ඉදිරියට දොළහ තෙක් රෝම ඉලක්කමෙන් ලියා ඇති පිටු අංකඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

(3). දැන් එම රෝම සංඛ්‍යාවලට අදාළ හින්දු අරාබි ඉලක්කම් ඉදිරියෙන් ලියන්න.

(4). අංක i රෝම ඉලක්කමෙන් ලියා නැත. එය ඔබට ලිවිය හැකි ය.

## ක්‍රියාකාරකම - 02

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| i | ii | iii | iv | v | vi | vii | viii | ix | x |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

1.ඉහත ආකාරයට සංඛ්‍යා කාඩ්පත් සකස් කර ගන්න.

2. ඒවා මිශ්‍ර කරන්න.

3. දැන් ඒ සියල්ල ම පෙට්ටියක් තුළට දමන්න.

4. පෙට්ටිය දෙස නොබලා එක් කාඩ්පතක් අතට ගන්න.

5. කාඩ් පතේ ඇති සංඛ්‍යාවට අදාළ රෝම සංඛ්‍යාව හෝ හින්දු අරාබි ඉලක්කම තෝරන්න.

**ඔබට පහත පරිදි සංඛ්‍යා ලැබෙනු ඇති.**

| | |
|---|---|
| 4 | iv |
| x | 10 |

# ක්‍රියාකාරකම - 03

1. සමාන දිගකින් යුතු ඉරටු හෝ බීම බට අසුවක් සපයා ගන්න.

(මේ සඳහා ගිනිකූරු වුවද යොදා ගත හැකි ය.)

2. ඔබ සපයා ගත් ද්‍රව්‍යවලින් පහත සඳහන් රෝම සංඛ්‍යා සාදන්න.

**v iv x ix**

**v යන සංඛ්‍යාවේ ඔබේ වම් අත පැත්තෙන් i තැබූවිට සෑදී ඇත්තේ iv යන සංඛ්‍යාවයි.**

**X යන සංඛ්‍යාවේ ඔබේ වම් අත පැත්තෙන් i තැබූ විට ix සංඛ්‍යාව සෑදී ඇත.**

**මින් පැහැදිලි වන්නේ වම් අත පැත්තෙන් තබන සංඛ්‍යාව මුලින් ඇති සංඛ්‍යාවෙන් අඩු වන බවයි.**

**v vi x xi**

**v යන සංඛ්‍යාවේ ඔබේ දකුණු අත පැත්තෙන් i තැබූවිට සෑදී ඇත්තේ vi යන සංඛ්‍යාවයි.**

**X යන සංඛ්‍යාවේ ඔබේ දකුණු අත පැත්තෙන් i තැබූ විට xi සංඛ්‍යාව සෑදී ඇත.**

**මින් පැහැදිලි වන්නේ දකුණු අත පැත්තෙන් තබන සංඛ්‍යාවමුලින් ඇති සංඛ්‍යාවට එකතු වන බවයි.**

දැන් මෙම හින්දු අරාබි ඉලක්කම්වලට අදාළ රෝම සංඛ්‍යා ඔබ සපයා ගත් ද්‍රව්‍යවලින් සාදන්න.

| | | |
|---|---|---|
| 12 - ................. | 16 -................. | 20 - ................. |
| 13 - ................. | 17 - ................. | 15 - ................. |
| 14 - ................. | 18 - ................. | 19 - ................. |

# ක්‍රියාකාරකම - 04

ඔබ සැදූ රෝම සංඛ්‍යා දෙස බලා පහත වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | අවශ්‍ය ගිනිකූරු / ඉරටු කූරු ගණන |
|---|---|
| i | |
| ii | |
| iii | **3** |
| iv | |
| v | |
| vi | |
| vii | |
| viii | **5** |
| ix | |
| x | |
| xi | |
| xii | |
| xiii | |
| xiv | |
| xv | |
| xvi | |
| xvii | |

| | |
|---|---|
| xvii | |
| xix | |
| xx | **4** |

## ක්‍රියාකාරකම - 05

5 ශ්‍රේණිය ගණිතය පෙළ පොතේ 136, 137 පිටුවල අභ්‍යාස කරන්න.